# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2077/13 - 2018 ජුනි මස 25 වැනි සඳුදා - 2018.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක. 02

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1995/10 හා 2016.11.29 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත අංක 1930/12 හා 2015.09.01 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව සඳහා පහත සඳහන් සංශෝධනයන් එක් කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

01. පිටු අංක 7A හි, 08 සටහන පහත පරිදි සංශෝධනය විය යුතු ය.

08. සටහන :-

(I) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස්වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(II) I වන ශ්‍රේණියේ නිලධරයන්ට අමතරව දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධරයන්ටද තෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා නියමිත පාඨමාලාව සම්පූර්ණ කළ හැක.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 මැයි මස 23 වන දින.

07 - 297


1A - G 27935 — 17 (2018/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*